www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පලස්තීන අධිකාරිය තුල කන්ඩායම්ක යුද්ධයක් ඇරඹේ

**Factional warfare breaks out in Palestinian Authority**

**ක්‍රිස් මාස්ඩන් විසිනි**

**2004 ජුලි 23**

පලස්තීන අධිකාරිය හෙල්ලුම්කන ලද කල්ලිවාදී කා කොටා ගැනීම් මගපෑදුනේ රජයේ ගොඩනැගිලි මත ප්‍රහාරවලට හා ආයුධ සන්නද්ධ මුන ගැටුම් සහ වෙඩි තබාගැනීම් ගනනාවකට ය. කල්ලිවාදී කා කොටා ගැනීම හේතුවෙන් පලස්තීන අධිකාරිය ඉරිතැලී ඇත.

එය: පලස්තීන අධිකාරියේ සභාපති යසර් අර්ෆත් වටා සිටින කල්ලියේ ඥාති සංග්‍රහයට හා දූෂනයට එරෙහි විරුද්ධත්වයක රූපාකාරය ගෙන ඇත. නමුත් දූෂනයට එරෙහි බැනරය පලස්තීන අධිකාරියේ නායකත්වය තුල සිටින අසමාන ස්ථර අතර ඇති බල අරගලය සඟවන්නේ මඳ වසයෙනි.

2005 දී සිදුවෙතැයි අපේක්ෂිත ගාසා තීරුවෙන් ඊස්රායල හට පිරිස් හා 7,500ක් පදිංචිකරුවන් ඉවත් කර ගැනීමට පෙර බලපාන ආස්ථානයන් හැසිරවීමේ උත්සාහයන් විසින් මෙය ඉදිරියට ගෙන එනු ලැබ ඇත. බටහිර ඉවුරේ මෙන් ම ගාසා තීරයේ පාලනය ද ඊස්රායලය කෙරෙහි පලස්තීන ප්‍රතිපත්තිය ද පිලිබඳව හා ලුප්ත පලස්තීනයක් නිර්මානය කිරීම සඳහා එක්සත් ජනපදය විසින් පිටුබලය සපයන යෝජනා පිලිබඳව කාලයක් පුරා පවතින ගැටුම් පටලවනු ලැබ ඇත.

අර්ෆත්ගේ බලය අවසානයේ දී රඳා පවතින පලස්තීන අධිකාරියේ පොලිස් හා ආරක්ෂක සංවිධානවල අර්ෆත්ගේ පාලනයට වල කැපීමේ උත්සාහයන් මත ගැටුම කේන්ද්‍රගත වී ඇත. ගාසා හි අර්ෆත්ගේ ප්‍රධාන පොලිස් අනදෙන නිලධාරී ගාසී ජබාලි මෙන් ම ප්‍රන්ස ප්‍රථමාධාර කම්කරුවන් 4 දෙනෙක්, අර්ෆත්ගේ ෆාටා සංවිධානයට අනුබද්ධ අල් අක්සා මාටිර්ස් බ්‍රිගේඩ් හි සාමාජිකයන් විසින් පැහැරගනු ලැබූ විට ගැටුම ජුලි 16 සිකුරාදා විවෘතව පුපුරා ගියේ ය. පැහැර ගැනීම පලස්තීන අධිකාරිය තුල දූෂනයට එරෙහිව සටන්කාමී කන්ඩායමක් විසින් මතුපිටින් විරෝධය පෑමක් වූ නමුත් මෙය අර්ෆත්ගේ ප්‍රතිමල්ලයා වන අගමැති අහමඩ් ක්වේරි විසින් බලය සඳහා ක්ෂනිකවම වාසියට හරවා ගනු ලැබී ය. ''පෙර නුවූ වියවුලක්'' පිලිබඳව පැමිනිලි කරමින් ක්වේරි පසු දින ම තම ඉල්ලා අස්වීම භාර දුන්නේ ය.

මිලියන ගනන් රාජ්‍ය මුදල් වංචා කිරීම හා කාන්තාවන්ට ලිංගිකව අඩන්තේට්ටම් කිරීම ද ඇතුලත් අපරාධ සඳහන් කරමින් පටිගත කල ප්‍රකාශයන් ඔහුගේ සිරකරන්නන් විසින් ජබාලි ලවා කියවනු ලැබී ය.

හදිසි තත්වය ප්‍රකාශ කිරීමට අර්ෆත්ට බල කෙරින. නමුත් පැහැරගැනීමට ඔහුගේ ප්‍රතිචාරය ගින්නට තෙල් එකතු කලා පමනි. ප්‍රථමයෙන් ජබාලිව නිදහස් කර ගැනීම සඳහා සාර්ථකව සාකච්ඡා කල ඔහු පසුව ජබාලිව නෙරපනු ලැබී ය. පසුව ඔහු තම බෑනා හා මිලිටරි රහස් තොරතුරු සේවා ප්‍රධානී මවුසා අර්ෆත්ව ගාසා තීරයේ හා බටහිර ඉවුර යන දෙකේ ම ආරක්ෂක ප්‍රධානියා ලෙස පත් කරනු ලැබී ය.

මවුසා අර්ෆත් බොහෝ සෙයින් ජනප්‍රිය නොවන අතර අපරාධකරුවෙක් හා දූෂකයෙක් ලෙස දැක ගනු ලැබේ. පලස්තීන අධිකාරිය තුල දූෂනයට එරෙහි මහජන උද්ඝෝෂන දෙකකට පොලඹවමින් ඔහුගේ පත්වීම ගාසා හි තත්වය අවුස්සා ලී ය. අල් අක්සා සාමාජිකයෝ මවුසා අර්ෆත්ගේ පාලනය යටතේ පවතින ආරක්ෂක හමුදා මූලස්ථානයට ප්‍රහාර එල්ල කොට ගිනි තබා බිමට සමතලා කලහ. ප්‍රතිසංස්කරන ගෙන ආවේ නැත්නම් දූෂිත නිලධාරින්ගේ නම් සඳහන් අත් පත්‍රිකා බෙදා හරින බවට සේනාංකය තර්ජනය කලහ. වෙඩි හුවමාරු කිරීම් දකුනු ගාසා හි රාෆා නගරය තුල දුසිමකට වැඩි ගනනකට තුවාල සිදු කලේ ය.

ගාසා හි ෆාටා සංවිධානයට එරෙහිව ඉස්ලාමීය මූලධර්මවාදී විරුද්ධත්වය වන හමාස් හා ඉස්ලාමීය ජිහාඩ් සංවිධාන තමන්ගේ පැත්තෙන්, අර්ෆත් පාක්ෂික නොවන කන්ඩායම් ද ඇතුලත් කර ගැනීම තෙක් රජය පුලුල් කිරීම ඇතුලත් දේශපාලනික හා ආරක්ෂක ප්‍රතිසංස්කරන අර්ෆත් ක්‍රියාත්මක කල යුතු යයි ඉල්ලා සිටිමින් ලිපියක් යැවී ය.

මවුසා අර්ෆත් පහල තනතුරක් සඳහා ආපසු කැඳවමින් යම් පදනමකට ඉඩ දීමට අර්ෆත්ට බල කරනු ලැබී ය. එම තනතුරට අබ්දෙල් රසෙක් අල් මජායිමේ මවුහ අර්ෆත් නැවත පත් කරන ලදි. නමුත් ඊට වඩා දුර නොයන බව ඔහු පැහැදිලි කලේ ය.

ජුලි 20 අඟහරුවාදා, ක්වේරි අගමැති තනතුරේ දිගටම සිටිය යුතු යයි වන අර්ෆත්ගේ ඉල්ලීමට ක්වේරි හිස නැමී ය. නමුත් තමන්ගේ ආන්ඩුව ''භාරකාර රජයක්'' පමනක් වන බව අවධාරනය කල ක්වේරි ආරක්ෂක සේවා පිලිබඳ පාලනය අර්ෆත් අත් හැර දැමුවේ නැති නම් තමන් ඉල්ලා අස් වන බව ප්‍රකාශ කලේ ය.

අර්ෆත් විසින් මජයිඩා යලි පත් කිරීම ''මහජනයා ගොනාට ඇන්දවීමට තවත් උත්සාහයක්'' හා ''ජාතික පරිපාලනය පිලිබඳ ප්‍රතිසංස්කරන හා වෙනසක්ම් මග හැරීමේ ක්‍රමයක්'' ලෙස සඳහන් කරමින් අල් අක්සා

විසින් ඉවත් කෙරිනි.

එදිනම තුවක්කුකරුවෝ අරෆත් විරුද්ධවාදියෙක් හා හිටපු පලස්තීන කැබිනට් ඇමතිවරයෙකු වන නබිල් අමර්ගේ රමාලා හි නිවසට පහර දී ඔහුට තුවාල සිදු කලහ. අමර් අරෆත්ව විවේචනය කරමින් රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක් දී තිබුනා පමනි. වෙඩි තැබීම ''බියගුලු ප්‍රහාරයක්'' ලෙස ක්වේරි හෙලා දැක්කේ ය.

කැබිනෙට්ටුව ''අභ්‍යන්තර තත්වය පාලනය කිරීමේ තම වගකීම ඉටු කිරීමට හා තම ජනයාගේ ආරක්ෂාව වර්ධනය කිරීමට අසමත්ව ඇත'' යි පවසමින් ක්වේරිගේ ඉල්ලා අස්වීම පිලිගැනීමට බල කරමින් ඊලඟ දිනයේ ම පලස්තීන ව්‍යවස්ථාදායක සභාව 43ට 4ක ඡන්දයකින් යෝජනාවක් අනුමත කලහ.

ව්‍යවස්ථාදායක සභාවේ කථානායක රවුහි ෆටූ ''සමස්ත පලස්තීන දේශපාලන වර්නාවලියම'' ඇතුලත් ජාතික එක්සත් ආන්ඩුවක් නිර්මානය කිරීම සඳහා ආයාචනා කලේ ය.

අරගලයේ යෙදී සිටින විවිධ කල්ලි අතර අර්ථභාරී වෙනස්කම් තිබුන ද අරෆත්ගේ වයස්ගත කල්ලිය විසින් තමන් පාලන බලයෙන් පිටමං කරනු ලැබීම පිලිබඳව හැඟීමේ දී එක්සත් වී ඇත. අරෆත්ගේ අනාගමික ජාතිකවාදී නායකත්වයේ වඩාත් විවෘත දේශපාලන විරුද්ධවාදියා වන ඉස්ලාමීය මූලධර්මවාදී හමාස් කන්ඩායම අරෆත්ගේ බටහිර ඉවුරේ බල කොටුවට විකල්ප බල පදනම ලෙස ගාසාහි පාලනය සුරක්ෂිත කර ගැනීමටත්, රජය තුල ස්ථානයක් සුරක්ෂිත කර ගැනීමටත් අදිටන් කර ඇත.

ක්වේරි හා 2003 දී ඉල්ලා අස්වූ ඔහුගේ පූර්වගාමී මහ්මූද් අබ්බාස් හෝ අබු මේසන් වැනි අය පලස්තීන ධනේශ්වරය තුල වඩා කලහකාරී හා භේදකාරී ස්ථරයක් නියෝජනය කරති. කෙසේ වූව ද, ඔවුන් සියලු දෙනා ම, පලස්තීන අධිකාරියේ අරෆත්ගේ ආධිපත්‍යය තමන්ගේ ම අභිමතාර්ථයන්ට අවහිරයක් ලෙස ද ගාසා මත හා බටහිර ඉවුරේ කොටස් මත සීමිත ස්වයං පාලනයක් සහතික කර ගනිමින් වොෂින්ටනය සමග සම්මුතියක් ඇති කර ගැනීමේ දී හා එමගින් පලස්තීන කම්කරු පන්තිය සූරාකෑමට තමන්ට ඇති හැකියාව දිග දුර පවත්වා ගැනීමේ දී වගකීමක් ලෙස ද දකිති.

අල් අක්සා මාර්ට්රිස් බ්‍රිගේඩ් හි කොටස්වලින් එන විරුද්ධත්වයකට ද අරෆත් මුහුන දෙයි. 42 හැවිරිදි හිටපු ආරක්ෂක ප්‍රධානී මොහොමඩ් ඩලාන් විසින් මෙහෙයවනු ලබන්නේ යයි කටකතා පැතිරී ඇති මොවුන් අරෆත්ගේ වයස්ගත කුඩා සහයෝගීකරුවන් හා පවුල් සාමාජිකයන් විසින් බලයෙන් පිටමං කරනු ලැබ ඇතැයි හඟින තරුන ස්ථරයෝ වෙති. ඔවුහු, ඊස්රායල වාඩි ලා ගැනීමට එරෙහි වඩා සටන්කාමී අරගලයක් වෙනුවෙන් කතා කරන්නන් වුව ද පැරනි රැකවල පසෙකට තල්ලු කිරීමේ ආශාව දූෂනයට හා ඥාති සංග්‍රහයට එරෙහි ඔවුන්ගේ උද්ඝෝෂනයේ වඩා තීරනාත්මක අවයවයක් වේ. සමාජ වර්ධනයන් සුරක්ෂිත කිරීමට හෝ ඊස්රායලය හා අධිරාජ්‍යවාදී බලයන් සමග සාකච්ඡාවෙන් හා සම්මුතියෙන් රාජ්‍යයක් ස්ථාපිත කිරීමට පලස්තීන අධිකාරියේ අසමර්ථතාව කෙරෙහි පැතිරුනු කලකිරීමට බද්ධ වී ඇති වඩා සටන්කාමී යයි පෙනෙන ආස්ථානයක ප්‍රතිඵලයක් ලෙස හමාස් සහ ඉස්ලාමීය ජිහාඩ් හි වැඩිවන බලපෑම මගින් ඔවුහු තර්ජනයකට ලක් කරනු ලැබ ඇතැයි හඟිති.

පලස්තීන අධිකාරියේ එක්සත් පවත්වා ගැනීමේ හා එහි බිඳ වැටීම වැලැක්විය හැකි එකම පුද්ගලයා ලෙස අරෆත්ව දකින ඊස්රායලය කුමන හෝ ප්‍රභවයකින් අරෆත්ට එරෙහි ව්‍යාපාරයක ඕනෑම වර්ධනයක් සාදරයෙන් පිලිගනී. හමාස් සංවිධානය ප්‍රමුඛත්වයට පත් වන්නේ නම්, එය, වැඩිදුර මිලිටරි වර්ධනය සඳහා ටෙල් අවිව් වෙත ක්ෂමාලාප සපයයි. නමුත් ඔවුන් පැහැදිලිව බලාපොරොත්තු වන්නේ නින්දිත සම්මුතියක් පිලිබඳ සාකච්ඡා කිරීමට වඩා සූදානම් වන පලස්තීන අධිකාරිය තුල සිටින බලයන් විසින් අරෆත්ව පදවියෙන් පහකරනු ලබනු ඇති බවයි. ඊස්රායල නියෝජ්‍ය ආරක්ෂක ඇමති සීවී බොයිම් ඊස්රායල ගුවන්විදුලියට කීවේ ''මෙම වර්ධනයෝ අවසානයේ අරෆත්ව පසෙකට තල්ලු කරනු ඇත. එවිට වඩාත් ගැඹුරු හා වගකිව යුතු බලයන් සමග කතා කිරීමට අපට හැකියාව ලැබෙනු ඇත'' යි තමන් බලාපොරොත්තු වන බවයි.

වොෂින්ටනය සටන්වල වාසිය ඩැහැගත්තේ ය. රාජ්‍ය ලේකම් කොලින් පවල් මාධ්‍යයන්ට කීවේ ''අප විශ්වාස කරන්නේ නිවැරදි ඉදිරි මාවතකට අරෆත් බලය අත් හැර දැමීම, සැබෑ විධායක බලය අගමැති වරයෙකුට පැවරීම, එම අගමැතිවරයා පලස්තීන ප්‍රජාවට අවශ්‍ය දේ කිරීම අවශ්‍ය කරන බවයි. එය සිදු වූ විට (සාමය කරා) මාර්ග සිතියමේ ඉදිරියට යාමට අපට පුලුවන''.

වොෂින්ටනයේ ඉල්ලීම එක්සත් ජාතීන් විසින් ද ප්‍රතිරාවය කරනු ලැබී ය. මහ ලේකම් කොෆි අනන් අවධාරනය කලේ අරෆත් ''අගමැතිවරයාට හා ඔහුගේ නායකත්වයේ අනෙකුත් සාමාජිකයන් ට ඇහුම්කන් දීමට කාලය ගත යුතු බවයි.''

සන්නද්ධ අරගලයේ හා ඊස්රායලය සමග සාකච්ඡාවේ සංයෝජනයක් තුලින් අනාගමික පලස්තීන රාජ්‍යයක් ස්ථාපනය කිරීමේ තම ජාතිකවාදී ඉදිරිදර්ශනයේ අසමර්ථතාව හේතුවෙන් මතු වූ කන්ඩායම්ක ගැටුම්වලට අවසානයේ දී අරෆත් දේශපාලන වගකීම දැරිය යුතු ය. සෝවියට් සංගමය බිඳවැටීමෙන් පසුව මැද පෙරදිග තුල එක්සත් ජනපදයේ අනභියෝගී ආධිපත්‍යයට තව දුරටත් විරුද්ධ වීම කල නොහැකි බව අරෆත් නිගමනය කලේ ය. බටහිර ඉවුරේ හා ගාසා තීරයේ ලුප්ත පලස්තීන රාජ්‍යයක් නිර්මානය කරන්නේ ය යන පොරොන්දුවට හිලවු ලෙස ඔහු 1993 දී ඔස්ලෝ සාම සම්මුතිවලට අත්සන් තැබී ය.

ඒ වෙනුවට පසුගිය දශකය දැකගෙන ඇත්තේ වාඩි

ලා ගනු ලැබූ ප්‍රදේශවල ඊස්රායලය විසින් සියොන්වාදී ජනපද කරනය ගොඩනැංවීම් වැඩි කිරීම සහ එක දිගටම හෝදාපාලුවට ලක් වූ පලස්තීනුවන්ගේ ජීවන තත්වයන් සොල්දාදුවන් සිය ගනනක් විසින් වටලනු ලැබ තිබුනු අල් අක්සා මුස්ලිම් පල්ලියේ ටෙම්පල් මවුන්ට් ස්ථානයට වත්මන් ඊස්රායල අගමැති ඒරියල් ෂැරොන් 2000 සැප්තැම්බරයේ දී කල ප්‍රකෝපකාරී සංචාරයට පසුව, දෙවන ඉන්ටිෆාඩාවක් ලෙස පුපුරා ගියේ ය.

කෙසේ වුවද අරෆාත්ගේ කිසිදු විරුද්ධවාදියෙක් ඔහුගේ අසාර්ථක ඉදිරිදර්ශනයට අවංක විකල්පයක් නියෝජනය නො කරති. හුදකලා වීම පිටුවහල් කිරීම හා ඊස්රායලය සහ එක්සත් ජනපදය විසින් ඝාතනය කිරීමට මුහුන නොදෙන නිසා ක්වේරි වොෂින්ටනය සහ ටෙල් අවිව් සමග සහයෝගීව කටයුතු කිරීමට පවා සූදානම් ය. සන්නද්ධ අරගලය පිලිබඳ ෆාටාහි අසාර්ථක ඉදිරිදර්ශනය යලි ඇරඹීම වෙනුවෙන් අල් අක්සා කතා කල ද තම ධනේශ්වර හිතවාදී පන්ති ආස්ථානයෙන් ගත් කල පැරනි අයගෙන් අති මූලික වසයෙන් වෙනස් වන්නේ නැත.

හමාස් හි මරාගෙන මැරෙන ප්‍රහාර හා එහි සුභ සාධන වැඩ පිලිවෙල වැඩිවැඩියෙන් අපේක්ෂා භංගත්වයට පත් වන පලස්තීන ජනගහනයේ සහයෝගය දිනා ගෙන ඇත. නමුත් ඉරානයේ හා අනෙකුත් තැන්වල පෙන්නුම් කර ඇති පරිදි පලස්තීනයේ ඉස්ලාමීය රාජ්‍යයක් ස්ථාපනය කිරීමේ හමාස්හි අරමුන, ධනේශ්වරයේ වෙනස් කොටසක් විසින් කම්කරු පන්තිය සූරාකෑමේ විකල්ප රූපාකාරයක් පමනක් අඩංගු කර ගනු ඇත. ටෙල් අවිව් විසින් ඔවුන්ව දිගු කාලයක් පුරා දැක ගනු ලැබ ඇත්තේ පලස්තීන අධිකාරිය අස්ථාවර කිරීමේ ප්‍රයෝජනවත් මෙවලමක් ලෙස වන අතර හමාස් හි මරාගෙන මැරෙන ප්‍රහාර ඊස්රායලය විසින් පුනරාවර්තීව ප්‍රහාර එල්ල කිරීම් හා ආක්‍රමනයක් සිදු කිරීමට සාධාරනීකරනයන් සපයා ඇත. තවද ගාසා හි පාලනය අල්ලා ගැනීම සඳහා වන එහි සැලැස්ම සාක්ෂි දරන ලෙස තමන්ගේ බල පදනම සුරක්ෂිත කරනු ලබන්නේ නම් ඊස්රායලය සමග සම්මුතියකට එලඹීමට තමන් නිරන්තරයෙන් සූදානම් බව හමාස් පෙන්වා ඇත.

පලස්තීන අධිකාරිය තුල සිදුවේගන යන බිඳවැටීම අරෆාත්ට කිසිදු සහයෝගයක් දීම මගින් වලක්වනු ලැබිය නොහැක. වාඩි ලා ගැනුනු ප්‍රදේශවල ප්‍රජාතන්ත්‍රවාදී මව්බිමක් පිලිබඳ ඔහුගේ පොරොන්දුව සම්පූර්නයෙන්ම නිෂ්ප්‍රභ වී නැති තතු තුල පලස්තීන ජාතික ව්‍යාපාරයේ විවිධ කොටස් බැඳ තබා ගෙන සිටින බොනපාට්වරයෙකුගේ භූමිකාව පමනක් ඔහුට රඟ දැක්විය හැකි ය.

පලස්තීන කම්කරු පන්තිය, පලස්තීන ධනේශ්වරයේ සියලු කොටස්වල දේශපාලනික බලපෑමෙන් බිඳිය යුතු අතර අරගලයේ නව මාවතක් සකස් කර ගත යුතු ය. පලස්තීන ජනතාවගේ විමුක්තිය සඳහා, ධනේශ්වර සූරාකෑමට හා අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට එරෙහි මැද පෙරදිග එක්සත් සමාජවාදී රාජ්‍යයක් නිර්මානය කිරීම සඳහා වූ අනාගමික හා සමාජවාදී ව්‍යාපාරයක් තුල තම ඊස්රායල් සහෝදර සහෝදරියන් සමග සහයෝගීව සමස්ත අරාබි කම්කරු පන්තියේ ම එක්සත් ප්‍රහාරයක් අවශ්‍ය ය.

© www.wsws.org